# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2025 අංක 10 දරන
# සේවකයන්ගේ අයවැය සහන දීමනාව
# (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2025 ජූලි මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2025 ජූලි මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2025 අංක 10 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2025 ජූලි මස 23 වන දින]

එල්.ඩී.- ඕ 19/2025

## 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2025 අංක 10 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(2) මේ පනතේ විධිවිධාන, 2025 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**2.** 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — 2016 අංක 4 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ “2015 මැයි මස 1 වන දින සිට බලපවත්වන පරිදි” යන වචන වෙනුවට “2015 මැයි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2025 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (2) වන උපවගන්තියේ “2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන” යන වචන වෙනුවට “2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2025 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා” යන වචන ආදේශ කිරීමෙන්.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ පිහිටි " ප්‍රකාශන පියස " හි දී මිල දී ගත හැක